DOI: 10.31357/fhssmst.2009.00028

# පරිපාලන සන්නිවේදනයේ සීමා

## රාජ්‍ය පරිපාලනයේ දී භාවිත සන්නිවේදනය පිළිබඳ අධ්‍යයනයක්

එච්. එම්. කේ. ජේ. බී. ගුණරත්න

බී. ඒ. (පේරාදෙණිය) එම්.පී.ඒ. (පී.අයි.එම්., ශ්‍රී ජ'පුර) ලේඛකත්ව හා සන්නිවේදන

ප.උ.ඩි.(ශ්‍රී ජ'පුර)

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා ජන සන්නිවේදනය

විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධනයයි.

නුගේගොඩ – ශ්‍රී ලංකාව

2009

0007

මෙම ශාස්ත්‍රීය නිබන්ධනය

මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මෙම නිබන්ධනය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්ව විද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

30 NOV 2009

එච්. එම්. කේ. ජේ. බී. ගුණරත්න

ලියාපදිංචි අංකය: GS/HU/1616/2002

මෙම අපේක්ෂකයා විසින් කරන ප්‍රකාශය සත්‍ය බවත්,
මෙම නිබන්ධනය ඇගැයුම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත්
කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

මහාචාර්ය තිස්ස කාරියවසම්

පාඨමාලා සමායෝජක/ජ්‍යෝෂ්ඨ මහාචාර්ය

## පටුන

පටුන iv

රූප සටහන් viii

ස්තුතිය ix

නිබන්ධන සාරාංශය x

1 පරිච්ඡේදය: හැඳින්වීම 1

1.1. පසුබිම (*Background*) 1

1.2. දළ විශ්ලේෂණය (*Overview*) 2

1.2.1. සන්නිවේදනය (Communication) 2

1.2.2. රාජ්‍ය පරිපාලනය (Public Administration) 3

1.2.3. පරිපාලන සන්නිවේදනය (Administrative Communication) 4

1.3. අධ්‍යයන ක්ෂේත්‍රය (Statement of the problem) 5

1.4. අභිප්‍රායය *(Significant)* 7

1.5. වාද විෂය *(The Issue)* 10

1.6. පර්යේෂණ අවශ්‍යතාව, විෂය හා සීමාව සහ පර්යේෂණ රාමුව (Research Requirement, Scope & Limitation, of the Study and Research Framework) 10

1.6.1. අධ්‍යනයේ සීමා (Limitation of the Study) 10

1.6.2. පර්යේෂණයේ අරමුණු (Objectives of the research) 12

1.6.3. පර්යේෂණ උපන්‍යාස (Statements of the research) 13

1.7. සාහිත්‍ය අධ්‍යනය *(Literature Review)* 13

1.8. ක්‍රමවේදය *(Methodology)* 14

1. 9. නියැදිය *(The sample)* 15

1.10. දත්ත විශ්ලේෂණය *(Data Analysis)* 16

1.11. පරිච්ඡේද සංක්ෂිප්තය *(The Chapter Outlines)* 16

2 පරිච්ඡේදය : සාහිත්‍ය අධ්‍යනය 19

2.1. හැඳින්වීම 19

2.2. සන්නිවේදනය 20

2.3. පරිපාලන සන්නිවේදනය 25

2.4. පරිපාලන සන්නිවේදයේ දී අදාල වන සන්නිවේදන සංකල්ප 25

2.4.1. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය 26

2.4.2. පුද්ගලාන්තර සන්නිවේදනය 28

2.4.3. කණ්ඩායම් සන්නිවේදනය 34

2. 4.4. සංවිධානමය සන්නිවේදනය 39

2. 4.5. උපායමාර්ගික සන්නිවේදනය (Strategic Communication) 42

2.4.6. සන්නිවේදනය සහ ආයතනික සංස්කෘතිය (Communication and Organizational Culture) 43

2.4.7. සන්නිවේදනය සහ ආයතනික වගකීම සහ වගවීම (Communication and Institutional Responsibility and Accountability) 44

2.4.7. සන්නිවේදනය සහ ආයතනික ව්‍යුහය (Organizational Structure) 45

2.4. 8. සන්නිවේදනය සහ තීරණ ගැනීම (Decision-Making) 46

2.4.9. මහජන සම්බන්ධතාව (Public Relation) 47

2.4.10. Negotiation 53

2.4.11. අවාචික සන්නිවේදනය 54

2.5. රාජ්‍ය පරිපාලනය 55

2.5.1. රාජ්‍ය පරිපාලනය අධ්‍යාපනික විෂයක් ලෙස 65

3 පරිච්ඡේදය: අධ්‍යනයේ අරමුණ, විෂය සීමාව සහ විධික්‍රමය 65

3.1. හැඳින්වීම 65

3.2. ගැටළුව 65

3.3. විධික්‍රමය 66

3. 3. 1. සාමාන්‍ය පරිපාලනය සඳහා වන සන්නිවේදනය 68

3. 3.2. මහජන සම්බන්ධතා සඳහා වන සන්නිවේදනය 70

3. 3.3. Negotiation සඳහා වන සන්නිවේදනය 71

3. 4. පරිපාලන සන්නිවේදනය තුළ ක්‍රියාත්මක සන්නිවේදන සංකල්ප හා ආකෘති 71

3. 5. විෂයපථය (Scope) 75

3. 6. සන්නිවේදන වර්ග 76

3. 7. ක්‍රමවේදය (Method of Study) 77

3. 8. සංකල්ප සහ අර්ථදැක්වීම් (Concepts and Definitions) 78

3. 8. 1. සන්නිවේදනය (Communication) 78

3. 8. 2. පරිපාලන සන්නිවේදනය (Administrative Communication) 79

3. 8. 3. රාජ්‍ය පරිපාලනය (Public Administration) 79

3. 8. 4. උපායමාර්ගික සන්නිවේදනය (Strategic Communication) 79

3. 8. 5. දත්ත සහ තොරතුරු (Data and Information) 79

3. 8. 6. මහජන සම්බන්ධතා (Public Relation) 80

3. 8. 7. Negotiation 80

4 පරිච්ඡේදය :_තොරතුරු විශ්ලේෂණය 83

4.1. හැඳින්වීම 83

4.2. මූලික නීතිය ,භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස සහ පරිපාලන සන්නිවේදනය 83

4.3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 84

4.4. පරිපාලන රෙගුලාසි 86

4.5. පරිපාලන සන්නිවේදනයේ දී අදාළ වන සන්නිවේදන සංකල්ප 89

4.5.1. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය 89

4.5.2. පුද්ගලාන්තර සන්නිවේදනය 89

4.5.3. කණ්ඩායම් සන්නිවේදනය 90

4.5.4. සංවිධානමය සන්නිවේදනය 96

4.5.5. උපායමාර්ගික සන්නිවේදනය 97

4.5.6. සන්නිවේදනය සහ ආයතනික සංස්කෘතිය 98

4.5.6. සන්නිවේදනය සහ ආයතනික වගකීම සහ වගවීම 99

4.5.7. සන්නිවේදනය සහ ආයතනික ව්‍යුහය හා තීරණ ගැනීම 101
4.5.8. සන්නිවේදනය සහ තීරණ ගැනීම 102
4.5.9. මහජන සම්බන්ධතා 103
4.5.10. Negotiation 105
4.5.11. අවාචික සන්නිවේදනය 105

5 පරිච්ඡේදය : සාකච්ඡාව (Analysis and Findings) 111
5.1. හැඳින්වීම 111
5.2. සොයා ගැනීම් *(Findings)* 112
5.2.1. පුද්ගලාන්තර සන්නිවේදනය 112
5.2.2. කණ්ඩායම් සන්නිවේදනය 115
5.2.3. සංවිධානමය සන්නිවේදනය 118
5.2.4. අමාත්‍යාංශ ලේකම්වරයාගේ, දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන්ගේ පරිපාලනමය බලතල සහ සන්නිවේදනයේ සීමා 120
5.2.4.1. ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් දොරටුපාල සංකල්පය ක්‍රියාත්ම වීම 122
5.2.4.2. කාර්ය මණ්ඩල හා සම්බන්ධ කටයුතු වලදී සංජානනය සහ දොරටුපාල සංකල්පය ක්‍රියාත්මකවීම 122
5.2.5. සන්නිවේදනය සහ ආයතනික සංස්කෘතිය 122
5.2.6. සන්නිවේදනය සහ ආයතනික වගකීම සහ වගවීම 125
5.2.7. අවාචික සන්නිවේදනය 125

6 පරිච්ඡේදය: සමාලෝචනය 128
6.1. හැඳින්වීම 128
6.2. නිරීක්ෂණ 128
6.3. නිර්දේශ 134
ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 136

## රූප සටහන්


**රූපය i:** පරිපාලන සන්නිවේදනයේ සීමා 6

**රූපය ii:** සන්නිවේදන විධි 24

**රූපය iii:** සන්නිවේදන ක්‍රියාවලිය 25

**රූපය iv:** අධ්‍යයන රාමුව (Study Framework) 67

**රූපය v:** ජෝර්ජ් ගාබනර්ගේ සන්නිවේදන ආකෘතිය 72

**රූපය vi:** වෙස්ලි සහ මැක්ලීන් සන්නිවේදන ආකෘතිය 74

**රූපය vii:** වයිට් දොරටුපාල ආකෘතිය 75

**රූපය viii:** ප්‍රගති සමාලෝචන ධූරාවලිය 121

# ස්තුතිය

ප්‍රථමයෙන්ම මාගේ කෘතඥතාව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සිංහල හා ජන සන්නිවේදන අධ්‍යනාංශයේ අංශාධිපති, මෙම පාඨමාලාවේ සමායෝජක ප්‍රමුඛ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ අදාළ අධ්‍යනාංශයේ උපදේශක මණ්ඩලය වෙත පිරිනමමි. ඔවුනගේ වර්ධනාත්මක විවේචනයන් සහ මහ පෙන්වීම මෙම කාර්යය සාර්ථකත්වයට ඉවහල් විය. එමෙන්ම, ඔවුන්ගේ වටිනා අදහස් අප දැණුම සහ කාර්ය ඵලසාධනය වර්ධනයටත් හේතු විය.

මෙම පාඨමාලවේ සමායෝජක සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාට මෙම අවස්ථාව අප වෙත ලබා දීම මෙන්ම ඊට අවශ්‍ය මහ පෙන්වීම සම්බන්ධයෙන් මාගේ ගෞරවනීය ස්තුතිය පිරිනමමි. ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධයෙන් මා සතු ඇල්ම සහ කුසලතාව වර්ධනයට එය මහෝපකාරී විය. එමෙන්ම, ජන සන්නිවේදන විෂය සම්බන්ධයෙන් නව මානයන් හඳුන්වා දෙමින් මෙම විෂය සම්බන්ධයෙන් අප දැක්ම පුළුල් කිරීමට ද එම ගුරුපදේශ ඉවහල් විය. මහාචාර්ය දම්මික ගංගංනාත් දිසානායක මහතා, මා ජන සන්නිවේදන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලව හදාරන සමයේ එම විෂය සම්බන්ධයෙන් අප තුළ ඇති කළ උනන්දුව මෙම ශාස්ත්‍රපති උපාධිය හැදෑරීමට මා යොමු කිරීමට හේතු විය. තවද, පර්යේෂණ ක්‍රමවේදයන් සරලව සහ ක්‍රමවත්ව ඉගැන්වීම මගින් මෙම අධ්‍යනය සඳහා අවශ්‍ය පිටු බලය සැපයූ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සේනානි හරිචන්ද්‍ර මහතාද ඉති සිතින් සිහිපත් කරමි. ඊට අමතරව, මෙම පාඨමාලාව සඳහා දේශකයින් වශයෙන් සහභාගී වූ සහ උපදෙස් ලබා දුන් නම් වශයෙන් සඳහන් කිරීමට නොහැකි වූ සියළුම ආචාර්යභවතුන් කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

අනතුරුව මෙම අධ්‍යනය සඳහා ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛණ ලෙස භාවිත පොත්, පත්, ලිපි, වෙබ් පිටු සැකසූ සියළුම විද්‍යාර්ථීන් ද, පරිපාලන සන්නිවේදනය හැදෑරීමට පසුතල සැපයූ මා සේවය කළ සියලුම අමාත්‍යාංශ හා ආයතනවල සහෝදර කාර්ය මණ්ඩලයද ඉති සිතින් සිහිපත් කරමි. තවද, න්‍යායාත්මක කරුණු සම්බන්ධයෙන් ප්‍රයෝගික දැණුම උද්දීපණය කළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සහ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ උපදේශකවරුන් ද, රාජ්‍ය සේවා පුහුණු ආයතනය ප්‍රමුඛ මාගේ සන්නිවේදන සංකල්ප බෙදා හදාගත් සියලුම පුහුණුලාභීන් ද ගෞරවයෙන් සිහිපත් කරමි.

අවසාන වශයෙන් ශාස්ත්‍රීය කටයුතු සඳහා අවශ්‍ය විවේකය සහ සහයෝගය සලසා දීම සම්බන්ධයෙන් මාගේ පවුලේ සාමාජිකයන් හා සමීප මිතුරන්ට ද, ඔවුන්ගේ කැපවීම සහ ඉවසීම සම්බන්ධයෙන් ස්තුතිය පල කරමි.

එච්. එම්. කේ. ජේ. බී. ගුණරත්න

# පරිපාලන සන්නිවේදනයේ සීමා

**එච්. එම්. කේ. ජේ. බී. ගුණරත්න**

## නිබන්ධන සාරාංශය

රාජ්‍ය පරිපාලනය හා සන්නිවේදනය අතර සම්බන්ධතාව පසුගිය දශක දෙකක පමණ කාල සීමාවක් තුළ වඩාත් අභියෝගාත්මක ප්‍රපංචයක් බවට පත් ඇත .පුද්ගලික අංශය සංවර්ධනයේ කේන්ද්‍රස්ථානය බවට පත් වීමත් සමගම රාජ්‍ය අංශය සහසුකම් සපයන්නාගේ භූමිකාව තෙක් ඌනනය වීම ඊට හේතුවයි. රාජ්‍ය පරිපාලනය යනු රජයේ ක්‍රියාකාරී පාර්ශවයයි .ව්‍යවස්ථාදායක විසින් සකස් කරනු ලබන සහ අධිකරණය විසින් අර්ථ දක්වන ලබන නීතිය ක්‍රියාත්මක කරනුයේ රාජ්‍ය පරිපාලනය විසිනි .එය පුළුල් අර්ථයෙන් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කරන ,සංවර්ධනය කරන සහ ඒ සම්බන්ධයෙන් අධ්‍යනය කරන ව්‍යුහය වශයෙන්ද හඳුන්වා දිය හැකිය. තොරතුරු තාක්ෂණ යුගයකට අවතීර්ණව සිටින වර්තමානයේ බහුලවම භාවිත වචනය සන්නිවේදනයයි. මිනිසාගේ මූලිකම අවශ්‍යතා වන ආහාර ඇඳුම් පැලඳුම් තරමටම හෝ ඊට ආසන්න මට්ටමකින් මිනිසුන් සන්නිවේදනයට ප්‍රමුඛත්වයක් දෙයි .මෙම අංශ දෙක යහපාලනයක් බිහි කිරීමේ දී අත්වැල් බැඳ ගත යුතුමය.

රාජ්‍ය පරිපාලනය හා සන්නිවේදනය එකක් අනෙක හා පවත්වන්නේ අවියෝජනීය සහ අවිවාද සම්පන්න සම්බන්ධතාවකි. රාජ්‍ය පරිපාලනය මෙන්ම සන්නිවේදනය ද විෂයක් වශයෙන් ස්වාධීනව වර්ධනයවී ඇත. එහෙත්, මෙම ක්ෂේත්‍රද්වය අතර සම්බන්ධතාවයේ ස්වරූපය තනි විෂයක් වශයෙන් අවධානයට ලක් වූ අවස්ථා දුලබය. ඒ අනුව, අන්තර්වර්ති පුද්ගල, පුද්ගලාන්තර, කුඩා කණ්ඩායම් හා අවාචික යන සන්නිවේදන විධි රාජ්‍ය අංශයේ සාමාන්‍ය පරිපාලනයේ දී, මහජන සම්බන්ධතාවල දී සහ *Negotiation* සඳහා යොදා ගන්නා ආකාරය මෙහිදී අධ්‍යනය කරයි. සන්නිවේදන අවස්ථා වශයෙන්, මානව සම්පත් කළමනාකරණය , උපායමාර්ගික සැලසුම්කරණය ,උපායමාර්ගික කළමනාකරණය ,විපර්යස්ථතා කළමනාකරණය , සැලසුම්කරණය ,ව්‍යාපෘති මෙහෙයවීම සහ ඇගයීම ,පසු විපරම් සහ ප්‍රගති සමාලෝචනය,

ආයතනික සංස්කෘතිය ,ආයතනික ව්‍යූහය ,තීරණ ගැනීම ,ආයතනික වගකීම සහ වගවීම ,මහජන සම්බන්ධතා හා *Negotiation* පෙන්වා දිය හැකිය.

අධ්‍යනයට අදාළ උපන්‍යාස වශයෙන් සලකන ලද්දේ (1).රාජ්‍ය පරිපාලනය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී එහි කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ එක් වැදගත් මෙවලමක් වශයෙන් පරිපාලන සන්නිවේදනය අවධානයට යොමු නොවී ඇති තත්වයක් තුළ සැලසුම් කරන ලද බොහෝ උපක්‍රම අසාර්ථක වී ඇත; යන්න සහ (2). පවත්නා පරිපාලන සන්නිවේදනය යනු සාර්ථක සන්නිවේදන එළඹුමක් නොවේ .එය තවදුරටත් කාර්යක්ෂම කිරීමට අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම පරිපාලන ප්‍රතිසංස්කරණ වලදී වැදගත්ය; යන්නත්ය. සන්නිවේදන ඉටු කරන කාර්යභාරය මෙන්ම එහි වැදගත්කම වෙනම අධ්‍යනය කිරීමෙන් වඩා යහපත් ප්‍රතිඵල ලබා ගත හැකිය. ඒ අනුව ,මෙම අධ්‍යනයේ අරමුණු වන්නේ පරිපාලන සන්නිවේදනයේ වත්මන් තත්වය විශ්ලේෂණ කිරීම තුළින් පවත්නා සන්නිවේදන ක්‍රියාවලියේ සඵලදායකත්වය අවධානයට ලක් කිරීම, පරිපාලන සන්නිවේදනය තුළ පවත්නා සීමාකම් අවබෝධ කර ගැනීම හා අදාල සීමාකම් අතික්‍රමණයට හඳුනාගත් උපක්‍රම සම්බන්ධයෙන් නිරීක්ෂණ සහ නිගමන ඉදිරිපත් කිරීමත්ය.

මෙම අධ්‍යනයේ දී, සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් සකසා ඇති රෙගුලාසි වල දක්වා ඇති විධිමත් සන්නිවේදන පටිපාටි අක්‍රීයව ඇති බව නිරීක්ෂණය වූ අතර, ඊට හේතුව නව කළමනාකරණ සංකල්ප සම්බන්ධයෙන් පවත්නා අඩු දැනුම, කුසලතාව හා අනවධානය බවද නිරීක්ෂණය විය. මෙනිසා වරින් වර යෝජිත, රාජ්‍ය පරිපාලන ප්‍රතිසංස්කරණ නිසි පරිදි ක්‍රියාත්මක නොවූ බව ඒ සම්බන්ධයෙන් අධ්‍යනයෙහි යෙදුනු විද්වතුන්ගේ අදහස විය. ඒ අනුව ඉහත සන්නිවේදන උපක්‍රම හඳුනාගත් අවශ්‍යතා සමග සමපාත කර ගැනීමට අවශ්‍ය ක්‍රමෝපායන් නිර්දේශ මගින් ඉදිරිපත් කෙරින. යහපත් රාජ්‍ය පරිපාලනයක් බිහි කිරීමට, රාජ්‍ය අංශයේ පූර්ණ ප්‍රතිසංස්කරණ පිළිගන්නා අතරම, අදාළ ප්‍රතිසංස්කරණ සන්නිවේදනය සඳහා සඵලදායී සන්නිවේදන ක්‍රමවේදයක් සකස් කිරීමේ අවශ්‍යතාවත් අධ්‍යනය විසින් අවධාරණය කර ඇත.

# 1 පරිච්ඡේදය

# හැඳින්වීම

## 1.1. පසුබිම (*Background*)

රාජ්‍ය පරිපාලනය හා සන්නිවේදනය අතර සම්බන්ධතාව පසුගිය දශක දෙකක පමණ කාල සීමාවක් තුළ වඩාත් අභියෝගාත්මක මෙන්ම සංකීර්ණ ප්‍රපංචයක් බවට පත් ඇත. පුද්ගලික අංශය ව්‍යාපාර කාර්යයන්හි සහ ආයෝජනයේ කේන්ද්‍රස්ථානය බවට පත් වීමත් සමගම රාජ්‍ය අංශයේ කාර්යය සහසුකම් සපයන්නාගේ භූමිකාව තෙක් ඌනනය විය. එහිදී නව විදේශ ආයෝජන මූලාශ්‍රයන් හඳුනා ගැනීමටත්, එකී ආයෝජන මෙරටට ආකර්ශනය කර ගැනීමටත්, ප්‍රවර්ධනයටත් නව මං සෙවීම රාජ්‍ය පරිපාලකයාගේ ප්‍රධාන කාර්යය බවට පත් විය. එමෙන්ම රජය සතු ව්‍යාපාර පෞද්ලිකරණය කිරීම මගින්, පාඩු ලබන ආයතන ලාභ ලබන තත්වයට පත් කිරීම ද රජයේ නව ප්‍රතිපත්තියක් බවට පත් විය. මෙසේ රාජ්‍ය අංශයේ ව්‍යාපාර පෞද්ගලීකරණය කිරීමේදී මෙන්ම සාර්ව ආර්ථික අරමුණු ළඟාකර ගැනීමටත්, කේන්ද්‍රීය සැලසුම් සහ වැඩසටහන් සැකසීමටත්, පිණිස නව ප්‍රතිපත්ති සම්පාදනයටත්, ඒ සඳහා නව සංස්ථානික ප්‍රවේශයක් සකස් කිරීමටත්, ක්‍රමවේදයන් සකස් කිරීමටත් රාජ්‍ය පරිපාලනයෙහි නියුතු නිලධාරීන්ට සිදු විය. මේ සඳහා තමා මෙතෙක් ගමන් කළ අවිඥ්ඥාණිකව රාජකාරී කිරීමේ භූමිකාවෙන් වෙනස්ව නව අධ්‍යාපනික හික්මීමක් අත්පත් කර ගැනීමට රාජ්‍ය නිලධාරීන්ට බල කෙරුණි.[1] වර්තමාන රාජ්‍ය පරිපාලනය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට සිදුව ඇත්තේ මෙවන් සංකීර්ණ වටපිටාවක් තුළදී ය.

රාජ්‍ය පරිපාලනය මීට දශක තුනකට එපිට දී ‘විධානය, එක් රැස් කිරීම හා රාජ සන්තක කිරීම’ (*Command, Collect and Confiscate*) මත පදනම් විය. එහෙත් වර්තමානයේ දී එය ‘සම්බන්ධතා, තරඟකාරීත්වය සහ සහයෝගයෙන් ක්‍රියා කිරීම’ (*Connect, Compete and Collaborate*) බවට පත් වී ඇත.[2] පසුව සඳහන් කළ පසුබිම යනු රාජ්‍ය පරිපාලනය තුළින් ප්‍රසස්ත සන්නිවේදන හැකියාවක් අපේක්ෂා කරන වටපිටාවකි. ඒ අනුව, රාජ්‍ය පරිපාලනය යනු කුමක්ද

යන්නත්, සන්නිවේදනය යනු කුමක්ද යන්නත් පරිපාලන සන්නිවේදනය ලෙස හඳුනා ගන්නා විෂය පරාසය තුළ පවත්නා සීමාකම් කවරේද යන්නත් අධ්‍යනය කිරීම මෙම නිබන්ධනයේ අරමුණයි.

## 1.2. දළ විශ්ලේෂණය (*Overview*)

### *1.2.1. සන්නිවේදනය (Communication)*

තොරතුරු තාක්ෂණ යුගයකට අවතීර්නව සිටින වර්තමානයේ බහුලවම භාවිත වචනය සන්නිවේදනය වශයෙන් හැඳින්වීම අතිශයෝක්තියක් නොවේ. තවද, මේ වන විට ලෝකයේ වැඩිම ලාභයක් උපදවන සමාගම් වන්නේද සන්නිවේදන සමාගම්ය. ජනමාධ්‍ය ආයතන, දූරකථන සහ ජංගම දූරකථන සමාගම් මීට උදාහරණ වශයෙන් දැක්විය හැකිය. මිනිසාගේ මූලිකම අවශ්‍යතා වන ආහාර ඇඳුම් පැලඳුම් තරමටම හෝ ඊට ආසන්න මට්ටමකින් මිනිසුන් සන්නිවේදනයට ප්‍රමුඛත්වයක් දෙන බවට මෙය සාක්ෂි සපයයි.

මානව සන්නිවේදනය පරිණාමයේ දී ද වැදගත්ම සාධකයක් විය. මිනිසාගේ ක්‍රියාකාරීත්වය තේරුම් ගැනීම යනු ඔහුගේ සන්නිවේදනය තේරුම් ගැනීම යැයි ජේම්ස් ඩබ්ලිව් ගිබ්සන් සහ මයිකල් එස් හැනා සිය මානව සන්නිවේදනයට හැඳින්වීමක් යන කෘතියෙහි සඳහන් කරයි.[3] සන්නිවේදනය සම්බන්ධයෙන් ගත් කල සෙසු සත්වයින්ට වඩා දියුණු මෙන්ම සංකීර්ණ සංකේත පද්දතියක් මිනිසා විසින් භාවිත කරයි. එය වාචික හෝ අවාචික විය හැකිය. විශේෂත්වය වන්නේ කවර සංකේත පද්දතියකට වුවද ප්‍රතිචාර දැක්වීමේ හැකියාවක් මිනිසා සතුවීමයි. මෙනිසා මිනිසා ස්වභාවයෙන්ම සන්නිවේදනය පාදක කරගත් සමාජශීලී සත්වයෙකු බවට පත්ව ඇත.

සන්නිවේදනය යන්න ඉංග්‍රීසි භාෂාවේ *Communication* යන යෙදුම අනුව සකස් කරගෙන ඇත. එය ලතින් භාෂාවේ *Communicare* යන වචනයෙන් බිඳී ආවෙකි.[4] ලතින් භාෂාවෙන් *Munis*

යන්නෙහි අර්ථය කිසියම් කාර්යයක් කරන්නා යන්නයි (*One does his duty*). *Communis* යන්න ජනයා අතර රැඳි යන තේරුම දේ (*Held in public*). මෙම වචන ආශ්‍රයෙන් සකසා ගත් *Communicare* යන්නෙහි අර්ථය පොදු බවට පත් කිරීම, ඇමතීම, බෙදා හදා ගැනීම, කථිකා කිරීම යන අර්ථ දේ.[5] විවිධ සන්නිවේදන විශේෂඥයෝ මේ සඳහා විවිධ අර්ථ කථන පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත. රේමන්ඩ් විලියම්ස් මහතා 'සන්නිවේදනය' ග්‍රන්ථයේ සඳහන් කරන්නේ "සන්නිවේදනය යන්නෙන් කුමක් අදහස් කරයි ද? ඉංග්‍රීසියේ *Communication* යන වචනයේ පැරණි ම අර්ථය සම්පිණ්ඩනය කළ හොත් කියවෙන්නේ අදහස් (*Ideas*) තොරතුරු (*Information*) සහ ආකල්ප (*Attitude*) එක් පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට යැවීමයි. එහෙත් පසුකාලීනව සන්නිවේදනය යන්නට තවත් අර්කථන එක් විය. එනම් එක් තැනක සිට තවත් තැනකට ඒවා රැගෙන යන රැහැන් හෝ, පෙළ හෝ වැලනය හෝ වාහනය යන්නයි.[6]

### *1.2.2. රාජ්‍ය පරිපාලනය (Public Administration)*

"රාජ්‍ය පරිපාලනය යනු රජයේ ක්‍රියාකාරී පාර්ශවයයි. ව්‍යවස්ථාදායක විසින් සකස් කරනු ලබන සහ අධිකරණය විසින් අර්ථ දක්වන ලබන නීතිය ක්‍රියාත්මක කරනුයේ රාජ්‍ය පරිපාලනය විසිනි."[7] එය පුළුල් අර්ථයෙන් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කරන, සංවර්ධනය කරන සහ ඒ සම්බන්ධයෙන් අධ්‍යයනය කරන ව්‍යුහය වශයෙන් ද හඳුන්වා දිය හැකිය.. සමාජය විසින් නිපදවනු ලබන පොදු භාණ්ඩ පරිශීලනය, මනා පරිහරණය, සාධාරණ සහ සඵලදායී රාජ්‍ය සේවයක් ඇති කිරීම එහි අරමුණු වශයෙන් හඳුන්වා දිය හැකිය. මහජනතාව වෙනුවෙන් ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබන, ඒවා කාර්යක්ෂමව පවත්වාගෙන යනු ලබන දේශපාලන ක්‍රියාවලියක් වශයෙන් ද රාජ්‍ය පරිපාලනය හඳුන්වා දිය හැකිය.

රාජ්‍ය අමාත්‍යාංශ, ආයතන සහ දෙපාර්තමේන්තු වල සේවය කරන, පුළුල් පරාසයක වගකීම් දරන විවිධ කාණ්ඩයන්ට අයත් රාජ්‍ය සේවකයන් විසින් රාජ්‍ය පරිපාලන කටයුතු මෙහෙයවනු ලබයි. රාජ්‍ය පරිපාලනය මගින් නීත්‍යානුකූලව සංස්ථාපනය කරන ලද ආයතන සඳහා දත්ත රැස්

කිරීම සහ විශ්ලේෂණය (සංඛ්‍යාණය), අයවැය අධීක්ෂණය, නීති කෙටුපත් කිරීම, ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සිදු කරයි. රාජ්‍ය නිලධාරීන් විසින් සමාජයේ ප්‍රමුඛ පෙළේ භූමිකා රැසක් නිරූපණය කරන අතර ඒවා නම්, පළමු පෙළ නිලධාරීන්ගේ භූමිකාව (සාම නිලධාරි *(Peace officers)*, ආරක්ෂකයින් *(Parole officers)*, දේශසීමා ආරක්ෂකයින් *(Border guards)*), පරිපාලකයින් (විගනනය), විශ්ලේෂක (ප්‍රතිපත්ති විශ්ලේෂණය) සහ රාජ්‍ය ආයතන සහ ශාඛාවන්හි කළමනාකරුවන්ගේ භූමිකාව යන මේවාය.[8]

තවත් අර්ථයකින් ගත් කළ රාජ්‍ය පරිපාලනය යනු අධ්‍යයන ක්ෂේත්‍රයකි *(Academic field)*. දේශපාලන විද්‍යාව වැනි සමාංතර විෂයන් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී රාජ්‍ය පරිපාලන විෂය නව විෂය ක්ෂේත්‍රයකි. එහි ආරම්භය 19 වන ශතවර්ෂයේ දී සනිටුහන් විය. විවිධ විෂයන්ගේ සංකලනයක් වූ එහි න්‍යාය සහ සංකල්ප දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, නීතිය, ශුද්ධ විද්‍යාව, කළමනාකරණය සහ ඉංජිනේරු විද්‍යාව වැනි සමාංතර විෂයන් රැසකගේ සංකලනයකි. එහි රාජ්‍ය පරිපාලනයේ අරමුණු සහ අභිප්‍රායයන් ලෙස සටහන්ව ඇත්තේ රාජ්‍ය සේවය තුළ සමානාත්මතාව, සමාජ සාධාරණත්වය, ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ සඵලදායීත්වය, වර්ධනය කිරීමත්, විශේෂයෙන් ලාභ නොලබන රාජ්‍ය ආයතන කළමනාකරණය කිරීමත්ය. අනෙක් අතට එය බදු රැස් කිරීම මගින් ලාභ උපයන ආයතනයක් වශයෙන් ද පෙන්වා දිය හැකිය. මෙය වගවීම *(Aaccountability)*, පාලනය *(Governance)*, විමධ්‍යගතකරණය *(Decentralization)* , සෘජු පාරිභෝගිකයා *(Clientele)* වැනි සංකල්ප මත ගොඩ නැගී ඇති අතර මෙම වචන ඒවායේ සංකල්පීය අර්ථයෙන් බැහැරව වැරදි සහගත ලෙස අර්ථ දැක්වීමක් සහ වාචාර්ථයෙන් භාවිත කිරීමත් සුලභ ලක්ෂණයක් බවට පත්ව ඇත.[9]

### *1.2.3. පරිපාලන සන්නිවේදනය (Administrative Communication)*

රාජ්‍ය පරිපාලන විෂයෙහි භාවිත සන්නිවේදන උපක්‍රම පරිපාලන සන්නිවේදනය වශයෙන් හැඳින්විය හැකිය. කෙසේ වෙතත් මෙය වෙනස් විෂය ධාරාවක් වශයෙන් ලෝකයේ ව්‍යාප්ත වීම ඇරඹී ඇත්තේ මෑත භාගයේය. කළමනාකරණ සන්නිවේදනයට අදාල සිද්ධාංත පරිපාලන